# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,634 — 1966 ජනවාරි 12 වැනි බදාදා — 1966.1.12**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 5 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | 6 | | |


## වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් වත්‍රරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුය.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

ආණ්ඩුවේ නිවාඩු දිනයන් හැරුණු විට සතියේ සෙනසුරා හැර සෑම දිනකම දහයේ සිට හතර දක්වාද, සෙනසුරාද දිනවලද දහයේ සිට එක දක්වාද ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර සතියේ දිනවල සවස 3 දක්වා ද, සෙනසුරාද දිනවල දවල් 12 දක්වා ද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිවම කාර්යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

---

### විශේෂ නිවේදනයයි

1966 ජනවාරි 20 වැනි බ්‍රහස්පතින්දා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1966 ජනවාරි 21 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1966 ජනවාරි 16 වැනි ඉරිදා ප. ව. 3.30 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

**බර්නාඩ් ද සිල්වා,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජනවාරි 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

---

5——බී 63571—5,463 (66/1)

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී.ඇම්. 7 දරන පෝරමය මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නො කළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

## පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 මැයි 5 වැනි දින දරන අංක 5418

SUMITOMO CHEMICAL COMPANY LTD.

" සයික්ලොප්‍රොපේන්කාබොක්සිලික් අම්ල එස්ටර " සංක්ෂේපය :—

මෙම නව නිර්මාණයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කරගත හැකි ය :—

1. පහත සඳහන් පොදු සූත්‍රය ඇති සයික්ලොප්‍රොපේන් කාබොක්සිලික් අම්ල එස්ටරයකි ;



මෙහි $X^1$, $X^2$, $X^3$ සහ $X^4$ යන එක එකකින් තේරුම් වන්නේ හයිඩ්‍රජන් සහ හැලජන පරමාණුවලින් ද මෙතිල් සහ ඇසිටොක්සි ඛණ්ඩකවලින් ද යුක්ත වූ කාණ්ඩයෙන් තෝරා ගත් සාමාජිකයෙකි. Z යනු ඔක්සිජන් සහ සල්ෆර් පරමාණුවලින් යුත් සාමාජිකයෙකි. F යන්නෙන් හැඟවෙන්නේ සයික්ලොහෙක්සේන් න්‍යෂ්ටියේ මොනයම් හෝ තැනෙක වූ ද්විත්ව බන්ධනයකි. R යනු මෙතිල් සහ මෙතොක්සිකාබොනිල් ඛණ්ඩක වලින් තෝරාගත් සාමාජිකයෙකි.

හිමිකම් ප්‍රකාශ 8 ක් ද නිදසුන් 30 ක් ද මෙහි තිබේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර් 20 වැනි දින,
කොළඹ දී ය.

1–143

---

හැම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන හැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ [illegible] විසින් " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි